# 2

# උදය සිරි

මිනිසා ද සෙසු සතුන් හා ගහකොළ, ඇළදොළ, කඳුහෙල් ආදිය මෙන් ම සොබාදහමේ නිර්මාණයකි. ඔහු ස්වභාවධර්මය තමන්ට රිසි පරිදි වෙනස් කිරීමෙන් සිය ගමන් මග සකස් කර ගත්තේ ය. එපමණක් නොව ස්වභාවධර්මයෙන් චමත්කාරයක් විඳීමට ද මිනිසා සමත් වෙයි. සිය සිතැඟි සොබාදහම අනුව සකස් වන ආකාරය ද සොබාදහමින් ලබන වින්දනය, ආස්වාදය හා ප්‍රබෝධය ද අනාවරණය කරමින් ඔහු කලා නිර්මාණකරණයේ යෙදෙයි.

ටිබැටයේ සිකීම් ප්‍රාන්තයේ උපත ලබා ලංකාවට සංක්‍රමණය වී දිවි ගෙවූ සිකීම් මහින්ද හෙවත් ඇස්. මහින්ද හිමි විසි වන සියවසේ සිංහල කාව්‍ය ක්ෂේත්‍රය පෝෂණය කළ ලේඛකයන් අතරේ ප්‍රමුඛයකු සේ පිළිගැනේ. උන්වහන්සේ විසින් රචිත උදය සිරි පද්‍ය පන්තියේ සොබාදහමේ ආශ්චර්යයෙන් මිනිස් ජීවිත ප්‍රබෝධවත් වන ආකාරය පැවසෙයි.

පිපේ නෙළුම් ඕලු ගඟේ විලේ ඇලේ
තිබේ වලාකුළු පහ වී නිලේ වෙලේ
නො පේන තෙක් ඈත මඟුල් ගෙයක් වගේ
සැදී සිටින්නේ ද ගසුත් වැලුත් ගලුත්

නිදන්නෙ ඇයි ? මේ ළමයෝ තවත් උදේ
නැඟී සිටින්නැයි අත ගා කියන්න සේ
ජනේලයෙන් දැන් හිරු රැස් ගලා වැටී
සිඹී මගේ මූණ පුරා උරා අහෝ

පිපී ගියා වූ ගන මූකලන් කැලේ
මලේ කොළේ පාට මෙසේ මෙසේ වෙතී
නෙළුම් කුමාරීට කියන්නවුන් වගේ
විලේ පියාඹත් බමරෝ රැරුං ගගා

උදැල්ල හා කැත්ත කරේ තබා ලා
සැහැල්ලුවෙන් බෝම දෙපා නගා ලා
දැකුම්කලුයි දැන් ගොවියා ගමන් ගත්
උදේ සිරීගේ සිරි ඉන් වැඩී වේ

සමන් නෙළුම් හා මහනෙල් ද රෝස
මලින් නැගී ආ සුවඳත් උරා බී
හමන්නෙ මේ සීත සුළං අලුත් වූ
පණක් දිදී මෙන් මට මේ වෙලාවේ

නිකම් ඉඳීමෙන් පල නෑ ගෙ මුල්ලේ
තමන් තමන්ගේ වැඩෙහී යෙදෙත්වා
කියන්නවුන් මෙන් ගන නිල් කැලෑවේ
අඬත් නටත් ගස් අතරේ කුරුල්ලෝ

## අවබෝධය

**කවි පෙළ කියවා පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

1. කවියේ දැක්වෙන පරිදි නෙළුම් සහ ඕලු මල් පිපෙන්නේ කොහේ ද?
2. විලෙහි බමරුන් පියාඹන්නේ නෙළුම් කුමාරිට කුමක් කියන්නාක් මෙන් ද?
3. ගොවියා උදෑසන තම වගා බිම් කරා ගමන් කරන ආකාරය ලියන්න.
4. සීත සුළං හමන්නේ කවර මල්වල සුවඳ උරා ගෙන ද?
5. ගස් අතරේ කුරුල්ලන් නටා අපට දෙන පණිවිඩය කුමක් ද?
6. උදෑසන අසිරිය පිළිබඳව කවියෙන් පැවසෙන අදහස කෙටියෙන් ලියන්න.

## ප්‍රායෝගික අභ්‍යාස

1. **සොබා දහම ගැන ලියවී ඇති නිර්මාණ එකතු කර පොත් පිංචක් සකස් කරන්න.**

# අපි කවි ලියමු

වැස්ස පිළිබඳ ලියවී ඇති පහත දැක්වෙන ඡේද දෙක කියවන්න.

- මිනිසාගේ පැවැත්මට වර්ෂාව අත්‍යවශ්‍ය ය. බීමට, නෑමට, රෙදි සෝදා ගැනීමට, වගාවට අවශ්‍ය ජලය ලැබෙන්නේ වර්ෂාව නිසා ය. වර්ෂාව නොමැති වූ කල නියඟ ඇති වේ. එවිට වගා බිම් පාළු වී ආහාර හිඟ වී යයි. මිනිසා ඇතුළු සියලු සතුන්ට ආහාර නැති ව යයි. වර්ෂාව වැඩි වූ කල ගංවතුර ඇති විය හැකි ය. එවිට අපි විවිධ ආපදා හා පීඩාවලට මුහුණ දෙන්නෙමු.
- හාත්පස පවතින අන්ධකාරය, විදුලි එළිය, අකුණු හඬ වැස්සක පෙර නිමිති ය. කුරුල්ලෝ කෑදලි කරා ඉක්මනින් පියාඹති. හෝ හඬ ළඟ ළඟ ම ඇසෙයි. ක්‍රමයෙන් වැහි බිඳු වහලක පතිත ව බිමට වැටෙයි. සීතල සිරිපොද ගත කිලිපොළා යයි. ගේ වටා ඇදෙන දිය දහරවල පා කරන්නට අපි කඩදාසි ඔරු සෑදුවෙමු. මහ වැස්සේ තෙමී නටන්නට සිතෙහි මහත් ආශාවක් පැන නැගෙතත් අම්මාගෙන් ඊට අවසරයක් නැත. දිගු නියඟකට පසුව වසින වැස්සෙන් අවට බිම් ද උතුරා යයි. ඒ දකින අපේ සිත් ද සතුටින් උතුරා යයි.

ඉහත ඡේද දෙක ම ලියා ඇත්තේ වැස්ස පිළිබඳව ය. එහෙත් පළමුවන ඡේදයට වඩා වෙනසක් දෙවන ඡේදයෙහි ඇති බව ඔබට දැනෙන්නට ඇත. පළමුවන ඡේදය වැස්ස පිළිබඳ වාර්තාවක ස්වරූපයෙන් ලියවුණකි.

දෙවන ඡේදය වැස්සෙහි සුන්දරත්වය පිළිබඳව නිර්මාණාත්මක ව ලියවුණකි. එහි භාෂාව භාවිත කර ඇති ආකාරය තරමක් වෙනස් ය.

වැස්ස ගැන ලියා ඇති කවි ද ඇත. පහත දැක්වෙන්නේ වැස්ස ගැන ලියා ඇති එබඳු කවියකි.

වැස්ස වගේ ආකාසෙන් වහින්න මං ආසයි
වතුර වගේ වැව් විල්වල පිරෙන්න මං ආසයි

ලියැදි දිගේ එහෙන් මෙහෙන් ගලන්න මං ආසයි
ළපටි ගොයම් දළුත් එක්ක නටන්න මං ආසයි

ඉහත ඡේද දෙක කියවන විට දැනෙන මිහිරට වඩා වැඩි මිහිරක් කවිය කියවන විට අපිට දැනේ. එම කවියේ සෑම පදයක් ම එක ම අකුරකින් අවසන් වී ඇත. එය එළි සමය වශයෙන් හැඳින්වේ. 'උදය සිරි' කවි පෙළෙහි එළි සමය නැති කවි ද ඇති බව ඔබට වැටහෙනු ඇත.

වාර්තාවක හෝ ලිපියක හෝ නැති තාලයක් කවියට ඇත. කවිය කියවන්නේ තාලයකට ය. වැස්ස ගැන ලියා ඇති ඉහත කවියේ පද ගළපා ඇති ආකාරය හා තාලය ගැන අවධානය යොමු කරන්න. මෙබඳු සරල කවි ඔබට ද නිර්මාණය කළ හැකි ය. ඒ සඳහා පොත පත කියවා ලබන දැනුම මෙන් ම පද ගැළපීමේ හැකියාව ද තිබීම අවශ්‍ය වේ. නිතර නිතර කවි කියවීමෙන් ලිවීමෙන් කවි නිර්මාණය කිරීමේ හැකියාව වැඩිදියුණු වීමට ඉවහල් වේ. එක ම කවිය වුව ද නැවත නැවත සකස් කර ලිවීමෙන් වඩාත් හොඳ කවි බිහි වේ. යම් කිසි මාතෘකාවක් පිළිබඳව ඔබේ සිතට එන හැඟීම් සියල්ල කඩදාසියක සටහන් කර ගන්න. පසුව වඩාත් ම උචිත වචන ගැළපෙන පරිදි යොදන්න. ඔබ අතින් මිහිරි කවියක් ලියැවෙනු ඇත.

## ප්‍රායෝගික අභ්‍යාස

1. **පහත දැක්වෙන කවිවල අඩු පද ලියන්න.**

කිරි මැණිකෙගෙ ටිකිරි හිනා  
වැහි වතුරට එකතු වුණා  
ගමේ වැවට ගොස් වැටුණා  
..........................................................................

අහසේ තරු දිලිසෙනවා  
හඳ මාමා නැග එනවා  
..........................................................................  
..........................................................................

සුළඟක් වී සිසිල දෙන්න මං හරි ආසයි  
..........................................................................  
..........................................................................  
..........................................................................

2. **ඔබ කැමති මාතෘකාවක්/තේමාවක් තෝරා ගෙන කවි 2ක් නිර්මාණය කරන්න.**

- ඔබ ලියූ කවි ඔබේ මිතුරා/ මිතුරිය සමග හුවමාරු කරගෙන ඔහුගේ/ඇයගේ අදහස ලබා ගන්න. ඒ අනුව කවිය නැවත සකස් කරන්න.
- ඔබ ලියූ කවි පන්තිය ඉදිරියේ ගායනා කරන්න.
- ඔබ ඇතුළු ව පන්තියේ මිතුරු මිතුරියන් විසින් නිර්මාණය කළ කවි එකතු කර නිර්මාණ සංග්‍රහයක් සකස් කරන්න.


නොමිලේ බෙදා හැරීම සඳහා ය.